ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2016 අගෝස්තු මස 01 වැනි දින |

## 2016 අප්‍රේල් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

2016 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. ප්‍රධාන වශයෙන් රථවාහන සහ සහල් ආනයනයෙහි වූ පහළ යෑම හේතුවෙන් ආනයන වියදම්හි සිදු වූ අඩු වීම, අපනයන ආදායම්හි සිදු වූ අඩු වීමට සාපේක්ෂව ඉහළ අගයක පැවතීම හේතුවෙන් 2016 අප්‍රේල් මාසයේ දී වෙළඳ හිඟය අඩු විය. අප්‍රේල් මාසය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සුළු වශයෙන් අඩු වුවද, සංචාරක ඉපැයීම් ඉහළ යෑම හේතුවෙන් ගෙවුම් තුලනයේ ජංගම ගිණුම ශක්තිමත් වූ අතර, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් තවදුරටත් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2016 අප්‍රේල් මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 707 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.9 ක සුළු අඩුවීමක් පෙන්නුම් කළ අතර, ඉහළ කාර්මික අපනයන ආදායමක් පැවතිය ද කෘෂිකාර්මික අපනයන පහළ යෑම මේ සඳහා හේතු විය. මුළු අපනයනයෙන් සියයට 77 ක් පමණ වන කාර්මික අපනයන ආදායම 2015 අප්‍රේල් මාසය සමඟ සැසඳීමේ දී සියයට 3.1 කින් වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් අපනයනයෙහි පැවැති යහපත් ක්‍රියාකාරිත්වය හේතු විය. යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන පිළිවෙළින් සියයට 3.7 කින් සහ සියයට 3.1 කින් වර්ධනය වීම පිළිබිඹු කරමින් මෙම මාසය තුළ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප

කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 340 ක් දක්වා සියයට 3.1 කින් වර්ධනය විය. තවද, කාර්මික නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති ආහාර, පාන වර්ග හා දුම්කොළ, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් යනාදියෙහි අපනයන ආදායම් ද 2016 අප්‍රේල් මාසයේ දී කැපී පෙනෙන ලෙස වර්ධනය විය. කෙසේ වුවද, තේ සහ කුළුබඩු අපනයන අඩු වීම මූලික කොටගෙන කෘෂිකාර්මික අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 12.4 කින් අඩු වීම හේතුවෙන් 2016 අප්‍රේල් මාසයේ සමස්ත අපනයන ක්‍රියාකාරිත්වය අඩාල විය. තේ සඳහා වූ ගෝලීය ඉල්ලුම අඩු වීම සහ අනෙකුත් රටවලින් කළ තේ සැපයීම ඉහළ යෑම මධ්‍යයේ ශ්‍රී ලංකාවේ තේ අපනයන පරිමාවන් සහ මිල ගණන් 2015 අප්‍රේල් මාසය සමඟ සැසඳීමේ දී අඩු වීම තේ අපනයන ආදායම අඩු වීමට හේතු විය. 2015 වසර අවසාන භාගයේ සිට දක්නට ලැබුණු අඩු වීමේ ප්‍රවණතාවය තවදුරටත් පෙන්නුම් කරමින් 2016 අප්‍රේල් මාසයේ දී කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 30.0 කින් විශාල ලෙස අඩු වූ අතර, කරාබු නැටි සහ ගම්මිරිස් අපනයනවල දුර්වල ක්‍රියාකාරිත්වය මේ සඳහා හේතු විය. තවද, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු ආහාර අපනයන ආදායම් ද මෙම මාසය තුළ දී පිළිවෙළින් සියයට 32.8 කින් සහ සියයට 18.6 කින් අඩු විය.

2016 පළමු මාස හතර තුළ දී මුළු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 3,435 ක් දක්වා සියයට 4.5 කින් අඩු වූ අතර ප්‍රවාහන උපකරණ සහ ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම් අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2016 වසරේ පළමු මාස හතර තුළ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර, මෙම රටවලට සිදු කළ අපනයන මුළු අපනයනවලින් සියයට 54 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2015 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2016 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **527.8** | **544.2** | **3.1** | **2,779.3** | **2,698.5** | **(2.9)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 330.2 | 340.5 | 3.1 | 1,588.1 | 1,709.8 | 7.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 22.4 | 23.8 | 6.4 | 131.8 | 98.8 | (25.1) |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 17.2 | 20.9 | 21.9 | 84.0 | 102.4 | 21.9 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 22.6 | 18.2 | (19.8) | 150.5 | 92.3 | (38.7) |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.3 | 10.7 | 28.4 | 48.9 | 49.8 | 1.9 |
| මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.0 | 8.3 | 65.9 | 20.2 | 23.8 | 17.8 |
| ප්‍රවාහන උපකරණ | 6.2 | 5.5 | (10.9) | 171.6 | 52.5 | (69.4) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.6 | 0.6 | (78.2) | 11.7 | 6.6 | (44.1) |
| වෙනත් | 113.3 | 115.7 | 2.1 | 572.3 | 562.5 | (1.7) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **182.1** | **159.5** | **(12.4)** | **801.0** | **721.8** | **(9.9)** |
| තේ | 102.0 | 93.2 | (8.7) | 437.4 | 406.3 | (7.1) |
| පොල් | 27.3 | 27.0 | (1.0) | 109.4 | 114.8 | 4.9 |
| කුළුබඩු | 18.6 | 13.0 | (30.0) | 109.5 | 73.9 | (32.5) |
| මුහුදු ආහාර | 14.1 | 11.4 | (18.6) | 57.5 | 57.9 | 0.8 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 11.9 | 8.0 | (32.8) | 55.5 | 36.1 | (34.9) |
| රබර් | 2.4 | 2.7 | 14.8 | 9.7 | 12.6 | 29.5 |
| වෙනත් | 8.3 | 6.9 | (16.6) | 31.8 | 32.7 | 2.8 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **3.4** | **2.9** | **(15.6)** | **17.4** | **14.3** | **(18.1)** |
| **මුළු අපනයන** | **713.4** | **706.6** | **(0.9)** | **3,597.7** | **3,434.6** | **(4.5)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

### ආනයන ක්‍රියාකාරිත්වය

2016 අප්‍රේල් මාසයේ දී ආනයන වියදම 2015 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,461 ක් දක්වා සියයට 2.0 කින් අඩු වූ අතර, විශේෂයෙන් රථවාහන සහ සහල් ඇතුළු පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි වාර්තා වූ අඩු වීම මේ සඳහා හේතු විය. රථවාහන ආනයනය අඩු කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්හි බලපෑම පිළිබිඹු කරමින්, 2016 අප්‍රේල් මාසයේ දී පෞද්ගලික රථවාහන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 28.8 කින් අඩු විය. 2016 අප්‍රේල් මාසයේ දී සහල් ආනයන වියදම අඛණ්ඩව දොළොස්වන මාසයටත් එ.ජ.ඩොලර් මිලියන 1.2 ක් දක්වා සියයට 94.7 කින් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු වූ අතර, මේ සඳහා 2015 වසරේ දී ඉතා සරු සහල් අස්වැන්නක් පැවැතීම හේතුවෙන් දේශීය වෙළඳපොළෙහි ප්‍රමාණවත් සහල් තොග පැවතීම

සහ රජය විසින් සහල් ආනයනය සඳහා වූ ආනයන බදු වැඩි කිරීම හේතු විය. තවද, ප්‍රවාහන උපකරණ, මූල ලෝහ, පොහොර, එළවළු සහ ඉන්ධන ආනයනය අඩු වීම මෙම මාසයේ දී ආනයන වියදම අඩු වීම සඳහා විශාල වශයෙන් දායක විය. කෙසේ වුවද, 2016 අප්‍රේල් මාසයේ දී තිරිඟු හා ඉරිඟු ආනයන වියදම සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, මේ සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන තිරිඟු ආනයනකරු වන සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම විසින් මාස තුනක විරාමයකින් පසු තිරිඟු ආනයනය කිරීම හේතු විය. මේ අතර, 2016 අප්‍රේල් මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 12.2 කින් සහ සියයට 22.3 කින් වර්ධනය විය. තවද, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ දියමන්ති හා අගනා ගල් වර්ග හා ලෝහ වර්ග ආනයන වියදම් ද මෙම මාසයේ දී වර්ධනය විය.


2016 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුළ සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 6,055 ක් දක්වා සියයට 3.6 කින් අඩු වූ අතර, මේ සඳහා ඉන්ධන, ප්‍රවාහන උපකරණ සහ සහල් ආනයනයේ වාර්තා වූ අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. 2016 පළමු මාස හතර තුළ දී චීනය, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවලින් සිදු කළ ආනයන මුළු ආනයනවලින් සියයට 57 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2015 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2016 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **376.0** | **316.2** | **(15.9)** | **1,567.3** | **1,425.5** | **(9.1)** |
| ආහාර හා පාන වර්ග | 149.0 | 117.4 | (21.2) | 611.8 | 516.9 | (15.5) |
| එළවළු | 34.1 | 18.4 | (45.9) | 142.2 | 140.1 | (1.5) |
| මුහුදු ආහාර | 13.0 | 17.4 | 33.9 | 57.9 | 78.1 | 34.9 |
| කුළුබඩු | 7.4 | 10.1 | 36.4 | 39.5 | 45.0 | 13.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 23.4 | 1.9 | (91.7) | 108.2 | 6.9 | (93.6) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 71.1 | 69.5 | (2.3) | 264.0 | 246.8 | (6.5) |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 227.0 | 198.9 | (12.4) | 955.5 | 908.6 | (4.9) |
| වාහන | 94.4 | 67.2 | (28.8) | 385.0 | 298.9 | (22.4) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 38.3 | 40.4 | 5.5 | 148.4 | 171.7 | 15.7 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 94.2 | 91.3 | (3.1) | 422.1 | 438.1 | 3.8 |
| **2. අන්තර් භාණ්ඩ** | **756.1** | **778.9** | **3.0** | **3,153.0** | **3,019.2** | **(4.2)** |
| ඉන්ධන | 212.6 | 200.8 | (5.5) | 921.7 | 686.5 | (25.5) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 180.8 | 198.3 | 9.7 | 768.9 | 896.8 | 16.6 |
| තිරිඟු හා ඉරිඟු | 9.9 | 51.1 | 415.4 | 86.8 | 105.6 | 21.7 |
| මූල ලෝහ | 46.4 | 26.5 | (42.8) | 160.9 | 105.4 | (34.5) |
| පොහොර | 31.7 | 13.0 | (59.0) | 86.4 | 54.1 | (37.5) |
| වෙනත් | 274.7 | 289.1 | 5.2 | 1,128.3 | 1,170.9 | 3.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **353.2** | **364.3** | **3.1** | **1,554.9** | **1,607.8** | **3.4** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 189.7 | 212.8 | 12.2 | 776.0 | 925.2 | 19.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 93.0 | 113.8 | 22.3 | 409.0 | 485.3 | 18.7 |
| ප්‍රවාහන උපකරණ | 70.1 | 37.3 | (46.7) | 367.9 | 195.1 | (47.0) |
| වෙනත් | 0.3 | 0.3 | 3.3 | 2.0 | 2.2 | 11.6 |
| **4. වර්ග නොකළ ආනයන** | **5.2** | **1.5** | **(71.6)** | **7.3** | **2.8** | **(61.5)** |
| **මුළු ආනයන** | **1,490.5** | **1,460.9** | **(2.0)** | **6,282.5** | **6,055.4** | **(3.6)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව<br>ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව<br>ලංකා අයි.ඕ.සී. සමාගම<br>ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




**වෙළඳ ශේෂය**

2016 අප්‍රේල් මාසයේ දී වෙළඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 754 ක් ලෙස, 2015 අප්‍රේල් මාසයේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 777 ට සාපේක්ෂව සියයට 2.9 කින් අඩු වූ අතර, මේ සඳහා අපනයන අඩු වීමට සාපේක්ෂව ආනයන තීව්‍ර ලෙස අඩු වීම හේතු විය. තවද, 2016 පළමු මාස හතර තුළ දී සමුච්චිත වෙළඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 2,621 ක් දක්වා 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති එ.ජ.ඩොලර් මිලියන 2,685 ට සාපේක්ෂව සියයට 2.4 කින් අඩු විය.

**සංචාරක ඉපැයීම්**

2016 මැයි මාසයේ දී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 125,044 ක් දක්වා ඉහළ ගිය අතර, එය 2015 මැයි මාසයට සාපේක්ෂව සියයට 10.1 ක වර්ධනයකි. ඒ අනුව, 2016 වසරේ පළමු මාස පහ තුළ දී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 846,229 ක් දක්වා සියයට 18.4 කින් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය 2016 වසරේ මැයි මාසයේ දී සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව එම මාසය තුළ දී සිදු වූ සංචාරක පැමිණීම්වලින් සියයට 52.2 කට දායක විය. 2016 වසරේ පළමු මාස පහ තුළ දී සංචාරක ඉපැයීම්[1] ප්‍රමාණය 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,184.4 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,402.5 ක් දක්වා වර්ධනය විය.

---

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2016 අප්‍රේල් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2015 අප්‍රේල් මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 585.9 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 578.0 ක් දක්වා සියයට 1.4 කින් අඩු විය. මේ අතර, 2016 වසරේ පළමු මාස හතර තුළ දී මුළු විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 2,371.4 දක්වා සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කළේය.

**මූල්‍ය ලැබීම්**

2016 වසරේ පළමු කාර්තුවේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදංචි සමාගම් වෙත වූ විදේශීය ණය ද ඇතුළුව විදේශීය සෘජු ආයෝජන ලැබීම්, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 346.4 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 164.5 ක් විය. මේ අතර, 2016 අප්‍රේල් මස අග දක්වා කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ.ඩොලර් මිලියන 19.5 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර එය, ද්විතියීක වෙළඳපොළ වෙතින් වූ එ.ජ.ඩොලර් මිලියන 20.8 ක ශුද්ධ ගෙවීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 1.3 ක ලැබීමකින් සමන්විත විය. 2016 වසරේ පළමු මාස හතරේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 25.7 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 565.2 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2016 වසරේ පළමු මාස හතර තුළ දී රජය වෙත වූ දිගුකාලීන ණය, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 57.0 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 67.5 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2016 වසරේ පළමු මාස හතරේ දී ගෙවුම් තුලනය 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 1,025.2 ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 958.0 ක හිඟයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2016 අප්‍රේල් මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.9 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 6.1 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.3 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 8.3 ක් විය.

2015 වසර අග සිට 2016 ජූලි මස 29 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 1.2 කින් මධ්‍යස්ථව අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව මෙම

කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝවලට එරෙහිව සියයට 2.6 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 14.6 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 6.3 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 4.3 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.2 කින් ද අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 11.1 කින් අධිප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2015 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2016 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 713.4 | 706.6 | -0.9 | 3,597.7 | 3,434.6 | -4.5 |
| ආනයන | 1,490.5 | 1,460.9 | -2.0 | 6,282.5 | 6,055.4 | -3.6 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -777.1 | -754.3 | -2.9 | -2,684.8 | -2,620.8 | -2.4 |
| සංචාරක ඉපැයීම් | 202.6(ආ) | 226.0 | 11.6 | 996.2(ආ) | 1,195.3 | 20.0 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 585.9 | 578.0 | -1.4 | 2,265.4 | 2,371.4(ආ) | 4.7 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 6.3 | -7.0 | -211.4 | 44.9 | -19.5 | -143.4 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 268.2 | 269.6 | 0.6 | 880.3 | 523.7 | -40.5 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 167.2 | 174.4 | 4.3 | 516.0 | 217.7 | -57.8 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | - | - | - |
| දිගුකාලීන ණය | 88.8 | 90.4 | 1.9 | 327.0 | 295.9 | -9.5 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 346.4 | 164.5 | -52.5 |

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ වසරේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ද ඇතුළත් වේ.